# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

## අභියාචනා අංක:- AAT/281/2025 (NPC)

එච්.එල්.ඒ.දිනේෂා ප්‍රියදර්ශනී

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.02.12**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු. අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඇය වෙත නිකුත් කර ඇති සේවය හැරයාමේ නිවේදනය ඉවත් කර නැවත සේවයේ පිහිටුවන ලෙසයි. ඇය විසින් ඉහත ඉල්ලීම ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇතත්, එකී ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා වූ ප්‍රමාදය සළකා බලා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉදිරිපත් වී ඇති කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඇයගේ අභියාචනය, ඇය විසින් ඉදිරියේදී ඇයගේ විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමට ඇති අයිතිවාසිකම රඳවා තබමින්, ඉල්ලා අස්කර ගැනීමට අවසර පතයි.

ඒ අනුව ඇය විසින් ඉටු කර ඇති සේවා කාලය සළකා බලා ඇය වෙත විශ්‍රාම වැටුප් අයිතිවාසිකම ලබා දෙන ලෙසට කරනු ලබන ඉල්ලීමට ඇති අයිතිවාසිකම රඳවා තබමින්, මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර දෙමු.

ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/